ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 2342/06 – 2023 ජූලි මස 24 වැනි සඳුදා – 2023.07.24
(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2019/136.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2021.07.05 දිනැති හා අංක 2235/13 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.05.10 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් වැලිවේරිය, මොරහේන වත්ත, අංක 132/28 බී හි පදිංචි කේ.පියරත්න මයා සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.06.21 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජූලි මස 12 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 039961 – 08 (2023/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**බේරුම් කිරීම් අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**
**විනිශ්චයකාර ආචාර්ය නීතිඥ පාලිත සේනාධීර මැතිතුමා ඉදිරිපිට දී ය.**

කේ. පියරත්න,
අංක 132/28/B,
මොරහේන වත්ත,
වැලිවේරිය.

*පළමු පාර්ශ්වය*

ගොනු අංකය : 1R /COM/01/2019/136

නඩු අංකය : A 50/ 2021

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

*දෙවන පාර්ශ්වය*

*අතර පවත්නා ආරාවුල*

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල මහතා 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 ( 1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව ඔහු වෙත එකී ආරාවුල නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වන මා පත් කොට මා වෙත යොමු කර ඇත.

කම්කරු කොමසාරිස් ජනරාල්ගේ 2021 මැයි මස 06 වන දිනැති ලිපියේ සඳහන් " ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කඩවත ඩිපෝවට අනුයුක්තව පින්තාරුකරුවකු ලෙස සේවය කරන කේ.පියරත්න මහතාව එම තනතුරේ ස්ථිර නොකිරීම මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ". මෙහිදී විසඳිය යුතු කාර්මික ආරාවුල වන්නේ පළමු පාර්ශ්වය වන කේ. පියරත්න වන අය 2008.11.06 වන දින දෛනික පදනම මත තාවකාලික කම්කරුවකු ලෙස දෙවන පාර්ශ්වයට අයත් කඩවත ඩිපෝවේ සේවයේ යොදවා ඇත. ඉන් අනතුරුව වැටුප් වැඩිවීමක් නොකර අයවැයෙන් වැඩි කරන ලද වැටුප පවා නොගෙවා සේවය ස්ථිර නොකර පළමු පාර්ශ්වයට බලවත් අයුක්තියක් සිදු කර ඇති ද යන්නයි.

මෙහිදී පළමු පාර්ශ්වය වෙනුවෙන් නියෝජිත එච්. ඒ. ජී. මයිකල් මහතා පෙනී සිටින ලදි. වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් නීතිඥ හාජර් ආසාර් මහත්මිය සමග නීතිඥ ගංගානී උක්වත්ත මහත්මිය පෙනී සිටින ලදි.

**ආරාවුලේ පසු බිම.**

පළමු පාර්ශ්වය 2008.11.06 වන දින දෛනික පදනම මත තාවකාලික කම්කරුවකු ලෙස දෙවන පාර්ශ්වයට අයත් කඩවත ඩිපෝවේ සේවය කළ බවද ඒ අතරතුර දෙවන පාර්ශ්වය විසින් විවිධ කාර්යන්වල පළමු පාර්ශ්වය යෙද වූ බවද ඒ වෙනුවෙන් මාසික වැටුප් ගෙවූ බවද, දෙවන පාර්ශ්වය තමා සේවයේ ස්ථිර නොකරන ලද බවද කම්කරු කොමසාරිස්වරයා විසින් 2019.07.19 වන දින සේවය ස්ථිර කරන ලෙසට නියෝගයක් කළද එය දෙවන පාර්ශ්වය පැහැර හැර ඇති බවද, පළමු පාර්ශ්වයට වැටුප් ගෙවීම පවා අයුක්ති සහගත ආකාරයට කර ඇති බවද, පොදුවේ සේවය ස්ථිර කිරීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛනය දෙවන පාර්ශ්වය නොසලකා හැර ඇති බවද, පළමු පාර්ශ්වය පෙන්වා දී ඇත.

දෙවන පාර්ශ්වයේ ස්ථාවරය වන්නේ 2008.11.06 වන දින සිට තාවකාලික කම්කරුවකු ලෙස සේවයට බඳවා ගත් බවත් 2010.07.22 සිට නොදන්වා සේවයට නොපැමිණි බවත්, 2012.06.01 සිට ඉල්ලුම්කරු පින්තාරු අංශයේ සේවයේ යෙදූ බවත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනය යටතේ සේවය ස්ථිර කිරීමට නොහැකි වූයේ ඉල්ලුම්කරු වයස 40 ඉක්මවා ගිය බව පෙනී ගිය නිසාත් යන්න දෙවන පාර්ශ්වයේ ස්ථාවරය වේ.

ප්‍රදානය ලබා දීමේ දී සලකා බලා ඇති කරුණු

ඉහත ඉල්ලුම්කරුගේ ස්ථාවරය සහ වගඋත්තරකරුගේ ස්ථාවරය ඔවුන්ගේ සාක්ෂි සටහන් සහ ලේඛන අනුව සලකා බැලිනි, එහිදී ඉල්ලුම්කරු A1 දරන ලේඛනය මගින් නම පත්වීම් ලිපිය සම්බන්ධයෙන් ද, A2 දරන ලේඛනය මගින් දෛනික පදනම මත වැටුප් ලබාගත් ආකාරය ද, A3 ලේඛනය මගින් කාර්යන් පැවරූ ආකාරයද, A4 ලේඛනය මගින් නම වැටුප් වාර්තාව ද, A 5 ලේඛනය මගින් චේතන සැකසූ ආකාරයද, A6 ලේඛනය මගින් සේවය ස්ථිර කිරීමේ අභියාචනය යොමු කරන ලද ලිපිය ද A7 ලේඛනය මගින් ස්ථිර සේවකයකු ලෙස පත් කරන ලෙස සහකාර කළමනාකරුගෙන් ඉල්ලා සිටින ලද ලිපිය ද, A8 ලේඛනය මගින් නැවතත් තනතුර ස්ථිර කරන ලෙස ගමනා ගමන මණ්ඩලයේ සභාපතිවරයාගෙන් ඉල්ලා සිටින ලද ලිපියද A9 ලේඛනය මගින් නැවතත් සේවය ස්ථිර කරන ලෙස ඉල්ලා සිටින ලද ලිපියක් ද A10, A 11 ,A 12 යන ලිපි වලින් ද ඔප්පු වෙන්නේ දිගින් දිගටම සේවය ස්ථිර කර ගැනීමට දරන ලද උත්සහයයි. A 14, A 15, A 16, A 17 දරන ලේඛන වලින් චක්‍රලේඛන වල දක්වන ලද නිතිමය තත්වය ගෙන හැර දක්වයි.

ඉහත කී සියලු චක්‍රලේඛන ද සියලුම ලේඛන ද සලකා බලන විට ඉතාමත් පැහැදිළි වන්නේ ඉල්ලුම්කරුහට ඇති නීතිමය අයිතිය මත ඉල්ලුම්කරු සේවය ස්ථිර කර ගැනීමට දරන ලද උත්සහයයි. ඒ බව ඉල්ලුම්කරු විසින් සනාථ කර ඇති අතර ඉල්ලුම්කරු ඉහත ලේඛන අනුව සනාථ කොට ඇත්තේ ඉහත කී චක්‍රලේඛ මගින් තමන්ට ඇති අයිතිය මත සේවය ස්ථිර කර දෙන ලෙසයි.

ඉන්පසුව වගඋත්තරකරුගේ කාර්ය විය යුත්තේ ඉහත කී ඉල්ලුම්කරුගේ සාක්ෂි බිඳ හෙළීමයි. වගඋත්තරකාර පාර්ශ්වය R1 ලේඛනයෙන් ඉල්ලුම්කරු සේවයට නොදන්වා නොපැමිණි බව තහවුරු කිරීමට උත්සහ දරයි. දෙවනුව අංක 20/2009 චක්‍රලේඛනය අනුගමනය නොකරන ලද්දේ පුරප්පාඩු නොමැති නිසා බව දැක්වීමට උත්සහ කරයි.

තුන්වනුව වගඋත්තරකරුවන් උත්සහ කරන්නේ 20/2009 චක්‍රලේඛය අනුව මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යංශයේ අනුමැතියක් නොලද බව ඔප්පු කිරීමටයි. සිව්වනුව වගඋත්තරකරුවන් උත්සහ කරන්නේ අංක 25/2014 (1) යන චක්‍රලේඛය සහ 25/2014 (11) දරන චක්‍රලේඛය මගින් අවලංගු වී ඇති නිසා සේවය ස්ථිර කිරීමට නොහැකි වූවා යැයි යන තර්කයයි. එයද ඔප්පු කිරීමට වගඋත්තරකරුවන් සමත් වී නොමැත. පස්වනුව වගඋත්තරකරුවන් උත්සහ කරන්නේ අංක 29/2019 චක්‍රලේඛය අනුව කටයුතු කිරීමට සුදානම් වුවද එකී චක්‍රලේඛය අනුව කටයුතු නොකළේ මන්ද යන්න ඔප්පු කර නොමැති බවයි.

ඉහත කී ආකාරයට දෙපාර්ශ්වයේ සාක්ෂි මැන බැලීමේ දී ඉල්ලුම්කරු සත්‍යතා වැඩිබර මත නඩුකරය ඔප්පු කර ඇති බවට තීන්දු කරමි.

වගඋත්තරකරුවන් සෑම විටම විවිධ ක්‍රමඋපායන් පාවිච්චි කරමින් චක්‍රලේඛ මත හා එකී චක්‍රලේඛය අයුක්ති සහ අසාධාරණ ලෙස නිර්වචනය කරමින් ඉල්ලුම්කරුගේ සේවය ස්ථිර නොකිරීමට උත්සහ දරා ඇති බව මනා ලෙස ඔප්පු වේ. මේ අනුව ඉල්ලුම්කරුගේ සේවය ස්ථිර නොකිරීම නිසා ඉල්ලුම්කරුට අයුක්තියක් සහ අසාධාරණයක් සිදු වී ඇති බවට නිගමනය කරමි.

ඒ අනුව වහාම ඉල්ලුම්කරුගේ සේවය 2008.11.06 සිට ස්ථිර කිරීමට නියෝග කරමි. තවද ඉල්ලුම්කරු සේවය ස්ථිර නොකිරීමෙන් ඔහුට ලැබිය යුතු වැටුප් සහ දීමනා ගෙවීම සම්බන්ධයෙන් ඉල්ලුම්කරු සාක්ෂි ඉදිරිපත් කර නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් නියෝගයන් නොකරමි.

ප්‍රදානය

ඒ අනුව ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය විසින් ඉල්ලුම්කරුගේ රැකියාව ස්ථිර නොකිරීම අයුක්ති සහගත සහ අසාධාරණ හෙයින් වහාම ඔහුගේ සේවය 2008.11.06 සිට ස්ථිර කරන ලෙසද, ඉල්ලුම්කරුගේ සේවා කාලයට සුදුසු තනතුරක පිහිටුවන ලෙසත් නියෝග කරමි. තවද ප්‍රදානය ගැසට් ගත කිරීමෙන් මසක් ඇතුළත සහකාර කම්කරු කොමසාරිස් නැගෙනහිර කොළඹ වෙත ඒ බව වාර්ථා කරන ලෙසද නියෝග කරමි.

මෙම ප්‍රදානය සාධාරණ සහ යුක්ති සහගත බවද ප්‍රකාශ කරමි.

ආචාර්ය නීතිඥ පාලිත සේනාධීර
බේරුම්කරු

2023 ජුනි මස 21 වැනි දින.

EOG 07 - 0222

මගේ අංකය: IR/COM/04/2017/09.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

අංක 2331/52 දරන හා 2023.05.12 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ, එක් පාර්ශ්වයක් වශයෙන් වස්කඩුව, කුඩා වස්කඩුව, ගාලු පාර, හේමන්ත හි පදිංචි ජී.දයා හේමන්ත සිල්වා මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, ජාවත්ත පාර, අංක 93, හි පිහිටි සීමාසහිත ලංකා සළුසල අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන්, බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 54/2019 දරන හා 2023.01.04 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් සීමාසහිත ලංකා සළුසල වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 54/2019 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2024.05.12 දින සිට අවසන් වන බවට පනතේ 20(2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජූලි මස 05 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

පළමුවන උපලේඛනය

**"අ" ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය : සීමාසහිත ලංකා සළුසල,
අංක 93, ජාවත්ත පාර,
කොළඹ 05.

දිනය : 2023 ජූනි මස 16 වැනි දින.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතට ය,

2023 මැයි මස 12 දිනැති අංක 2331/52 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, සීමාසහිත ලංකා සළුසල සහ ජී.දයා හේමන්ත සිල්වා බැඳී සිටින්නාවූ ද, 2023 ජනවාරි මස 04 වැනි දින දරන බේරුම්කරුගේ තීරණය (A/54/2019) ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

නීති නිලධාරි
සීමාසහිත ලංකා සළුසල,
අංක 93, ජාවත්ත පාර,
කොළඹ 05,

*පිටපත* : (අනෙකුත් පාර්ශ්වය)
ජී.දයා හේමන්ත සිල්වා,
"හේමන්ත", ගාලු පාර,
කුඩා වස්කඩුව, වස්කඩුව.

1) ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාචෝචිත පරිදි තීරණයෙන් බැදී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්තිය බලන්න)

2) දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවා යෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයකු වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන්ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුරද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 07 – 0223

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.